## (හැඳින්වීම)

අද දින සාන්ත සභා  මාතාව විසින් නැසීගිය සියලු විශ්වාසිකයන් සිහිපත් කරමින් මළවුන්ගේ මංගල්‍යය පවත්වන්නීය.

ස්වාමින් වහන්සේ මරණය සදහටම විනාශ කර දමන බව අදට නියමිත පළමු දේව ප්‍රකාශනයෙන් පැවසෙන අතර, ක්‍රිස්තුන් වහන්සේගේ දිවි පිදීම කරණකොටගෙන අප සැමට පාපයෙන් ගැළවීම සහ දේව පුත්‍රභාවය උරුම වූ බව දෙවන දේව ප්‍රකාශනයෙන් සඳහන් කරයි.

තවද පුත්‍රයාණන් වහන්සේ දැක, අදහාගන්නා සියල්ලන්ට පියාණන් වහන්සේ වෙතින් සදාතන ජීවනය හිමිවන බව ද,  අන්තිම දවසේ දී ක්‍රිස්තුන් වහන්සේ ඔවුන් සැම උත්ථාන කරනු ලබන බව ද සුපුවතින් ප්‍රකාශ කරනු ලබයි.

එබැවින් අප මීසම් සංඝය සහ අප පවුල් තුළින් වියෝවූ සියලු විශ්වාසිකයන් සිහිපත් කරමින් , ඔවුන්ගේ ආත්මයන්ට නිත්‍ය සැතපීම දානය කරන මෙන් අපි දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරමු. එසේම අප සැමට ද දිනෙක ස්වර්ගීය සැපත හිමිකර ගන්නට හැකිවන ලෙසින් මෙලොව ජීවිත ගත කරන්නට අවශ්‍ය ශුද්ධාත්ම වරම් යදිමින් මෙම උතුම් වූ දිව්‍ය යාගයට භක්තිමත්ව සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී , අප විශ්වීය එඬේරාණන් වන ෆ්‍රැන්සිස් සුදතුම් පියතුමන් ඇතුළු පූජක, පැවිදි හා ගිහි සැම ශුද්ධාත්ම වරප්‍රසාදයෙන් පුරවා , ස්වර්ගීය සැපත උදෙසා ම දිරි වඩන්නට අවැසි නිසි මග පෙන්වීම අප සභා මාතාව වෙත නිරතුරු දානය කරන පිණිස,

2) අබ්බා පියාණනී, අප මීසම වෙනුවෙන් කැපවී සේවය කර, මෙලොව ජීවිතයෙන් සමුගත් පූජක සහ පැවිදි සැමට ද, අප අතරින් වියෝවූ අප පවුල්වල සියලු සාමාජික සාමාජිකාවන් සහ ඥාති හිතමිතුරු සැමට ද, ඔබවහන්සේගේ ශ්‍රී වත මඬල දැක ගැනීමේ භාග්‍ය උදා කරන පිණිස,

3) ආදර දෙවි පියාණනී, කිසිඳු යාච්ඤා පිළිසරණක් නොලබා වේදනාවෙන් තැවෙන, ශුද්ධිකාගිනි ස්ථානයේ සිටින සියලු ආත්මවලට ගැළවීම ලබා දී, සමිඳු නිවහනේ සදාතනික සුවය හා සාමය ලබන්නට ස්වර්ග රාජ්‍යය වෙත ඔවුන් කැඳවා ගන්නා පිණිස,

4) ආදර දෙවි පියාණනී, අප සියල්ලන්ට ද දිනෙක මරණය උරුම වන බව නිතර සිහිපත් කරමින්, යහපත් කිතුණුවන් ලෙස මෙලොව දිවි ගෙවන්නට ද, ලෞකික සම්පත්වලට වඩා දේව ප්‍රේමය සහ කරුණාව කෙරෙහි විශ්වාසය තබන්නට ද අපට මග පෙන්වන පිණිස,